**ශීර්ෂය 279 කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම් ශේෂ 04ක 2021 වර්ෂයේ අවසාන ශේෂ හා 2022 වර්ෂයේ ආරම්භක ශේෂ අතර රු.1,674,053 ක වෙනසක් පැවැතිණි. | ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලින් තොරතුරු ලබා ගෙන මෙම වෙනස්කම් නිවැරදි කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතු වීම. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නොවූ රු.270,000 ක විදුලි ජනක යන්ත්‍ර 10 ක් සහ කඩා ඉවත් කළ රු.6,945,000ක් වූ පැරණි ගොඩනැගිල්ලක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතු වීම. |
| (ඇ) | රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැති ස්ථාවර වත්කම් ශේෂ 04ක වටිනාකම රු.1,000,705ක් වැඩියෙන් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දන්වා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතු වීම. |
| (ඈ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු ගොඩනැගිලි 33ක් ගිණුම්ගත කර නොතිබුණි. ඉන් ගොඩනැගිලි 04ක පිරිවැය රු.6,852,766ක් වූ අතර ගොඩනැගිලි 29ක පිරිවැය හෝ තක්සේරු අගය නිශ්චය කර නොතිබුණි. එමෙන්ම, ගොඩනැගිලි 11ක තක්සේරු වටිනාකමට වඩා රු.352,939,402ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | රජයේ තක්සේරුව ලද පසු ගිණුම්ගත කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතු වීම. |
| (ඉ) | රඹුක්කන ප්‍රදේශයේ ඉදිකළ රු.2,995,042ක් වූ සේවා පියස 05ක් හා කැගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සතු රු.26,700,000 ක් වූ වාහන 03 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වත්කම් ගිණුම්ගත කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතු වීම. |
| (ඊ) | ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය 1998 වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා තිබුණ ද, රු. 62,400,000ක් වූ එම ඉඩම හා ගොඩනැගිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි. | නැවත අත්පත්කර ගැනීම සඳහා ගැසට් පත්‍රය සංශෝධනය කර ගැනීමට මේ දක්වා නොහැකි වී තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය අනුව වර්ෂයේ අග්‍රිම ලැබීම්වලට වඩා රු.274,753,336ක් වැඩියෙන් එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | පිළිගනිමි. නිවැරදි කරන ලද අග්‍රිම ගිණුම් ප්‍රකාශනය මේ සමග අමුණා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතු වීම. |

### 1.6.2 විගණන සාක්ෂි නොවීම

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම්වල දක්වා තිබුණු රු. 28,432,000ක ගොඩනැගිල්ලක් සනාථ කිරීමට සාක්ෂි නොතිබුණු අතර රු. 27,340,000ක ඉඩම් සඳහා පිඹුරුපත් හැර අයිතිය තහවුරු කිරීමට ඔප්පු ඉදිරිපත් නොවුණි.

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දරිද්‍රතාව තුරන් කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේදී හඳුන්වා දුන් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ කැගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටුවා තිබුණු ග්‍රාම ශක්ති සමිති 130න් 115ක් 2022 දෙසැම්බර් 31 දින වනවිට අක්‍රීය වී තිබුණි. ග්‍රාම ශක්ති මව් සමිති ගිණුම්වල හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන යටතේ වන ගිණුම්වල 2022 දෙසැම්බර් 31 දිනට පැවැති රු.57,605,311ක් අරමුණුගත කාර්යයට යෙදවීමකින් තොරව නිෂ්කාර්යව පැවැතිණි. | සමිති ගිණුම්වල පවතින මුදල් වැයකර ඵලදායීව ප්‍රජා සංවර්ධන කටයුතු ඉටු කිරීමට උපදෙස් ලබා දුන්නද ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට යාමේදී ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවී ඇති බව දන්වා ඇත . | නිවැරදිව සැලසුම් කර උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | කැගල්ල දිස්ත්‍රික්කය තුළ 2016 වර්ෂයේදී ඇති වූ නායයෑමේ අවදානම නිසා විපතට පත් පවුල් 154කට නැවත පදිංචිය සඳහා රු.150,505,800ක් ගෙවා තිබුණි. එහෙත්, ඔවුන් අවදානම් සහිත නිවාසයේම පදිංචි වී සිටීම, ගෙවූ මුදලට සරිලන ලෙස නිවසේ වැඩ අවසන් නොකිරීම, මිලදීගත් ඉඩම හා වැඩ අවසන් කළ නිවස විකිණීම, මුදල් ලබා දී ඇතත් වැඩ ආරම්භ නොකිරීම වැනි හේතු මත නැවත පදිංචි කිරීමේ එම ව්‍යාපෘතියේ සාර්ථකභාවය ගැටළු සහගත විය. එමෙන්ම, මෙම නායයෑම් හේතුවෙන් එම පවුල් නැවත පදිංචි කිරීම සඳහා 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.393,161,033ක් 2022 දෙසැම්බර් 31 දක්වාම ගෙවා නොතිබුණි. | 2016 සිට 2021 වර්ෂය දක්වා ප්‍රතිපාදන ලබා දී තිබුණද, අවදානම් සහිත නිවාසයේ පදිංචි වී සිටීම,ගෙවන ලද මුදලට සරිලන ලෙස නිවසේ වැඩ අවසන් නොකිරීම, මුදල් ලබාදී ඇතත් වැඩ ආරම්භ නොකිරීම වැනි කරුණු මත අදාළ ගෙවීම් සිදු කළ නොහැකි තත්ත්වයක් උද්ගත වූ හෙයින් ගෙවීම් සිදු කළ නොහැකි විය. | මේ සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් සිදුකර සුදුසු තීරණගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිවයිනේ වනාන්තර වැස්ම 2030 වනවිට සියයට 32කින් වර්ධනය කිරීම වෙනුවෙන් දිවයින පුරා පැළ මිලියන 75ක් සිටුවීමේ **"**සෑම අයෙක් එක් පැළයක්**"** වැඩසටහන කෑගල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර නොතිබුණි. | වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි බව දන්වා ඇත. | මෙවැනි වැඩසටහන් සඳහා ප්‍රමුඛතාව ලබා දී ක්‍රියාකළ යුතු වීම. |

## 2.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ කුකුල් පාලන ගම්මාන ඇතිකිරීම වෙනුවෙන් කිකිළි පැටවුන් **1476**ක් හා අනෙකුත් යටිතල පහසුකම් වෙනුවෙන් රු.**808,432**ක් වැයකර තිබුණි**.** එහෙත්**,** එම අරමුදල් මගින් ව්‍යාපෘති අරමුණුවලට කිසිදු සබඳතාවක් නොමැති මාර්ග **06**ක් ඉදිකිරීම වෙනුවෙන් රු**.2,941,108**ක් වැයකර තිබුණු අතර එය අරමුණුගත අවශ්‍යතා වෙනුවෙන් කළ වියදමින් සියයට **264** ක ප්‍රතිශතයක් විය**.** | මේ සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන ඇති අතර, ප්‍රතිලාභීන්ට සිය නිෂ්පාදනය හා අලෙවියට ඉන් පහසුවක් සැලසෙන බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | ව්‍යාපෘතියේ අරමුණු සඳහා ප්‍රමුඛතාව ලබා දී සැලසුම් සකස් කළ යුතු වීම. |

## 2.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ඉටු කිරීමට නියමිතව තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 589 ක් වූ ව්‍යාපෘති 4204ක් ඉටුකළ නොහැකි වී තිබුණු අතර, රු. මිලියන 30ක් වූ ව්‍යාපෘති 65ක් අර්ධ වශයෙන් ඉටුකර තිබුණි. | රටේ පැවැති කොරෝනා වසංගත තත්ත්වය මත ඊළඟ වසරේදී වත් නිම කිරීමට හැකි වේ යැයි බලාපොරොත්තු වෙමි. | මූලික අවශ්‍යතාවන්ට ප්‍රමුඛතාව ලබා දෙමින් ඉදිරියේදී එම ව්‍යාපෘති ඉටු කළ යුතු වීම. |

## 2.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා දෙහිඕවිට දැරණියගල මාර්ගයට යාබද ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ. | | |
| (අ) ඉඩම් කැබලි 52 ක් සඳහා 2014 වර්ෂයේ සිට මේ දක්වාම ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 9 වන වගන්තිය යටතේ වන්දි පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණු අතර, පරීක්ෂණ පැවැත්වූ ඉඩම් කැබලි 112 ක් තක්සේරු කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | නැවත මිනුම් ගෙන අඩුපාඩු සකස්කර තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණි. | තක්සේරු වාර්තා ලබා ගෙන වන්දි පරීක්ෂණ කඩිනමින් පැවැත්වීම. |
| (ආ) කැබලි 32කට රු.15,658,038 ක වන්දි මුදල් ලබා ගැනීමට 2022 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කර තිබුණද, 2022 දෙසැම්බර් 31 දින දක්වාම එම මුදල් ලැබී නොතිබුණි. | වන්දි ගෙවීම්, මාර්ග සංවර්ධන අධිකාරියෙන් දැනුම් නොදෙන බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කළ යුතු වීම. |
| (ඇ) ඉඩම් වෙනුවෙන් ගෙවූ රු.65,109,388 ක වන්දි මුදලට අදාළ පොලී මුදල් ලබා ගැනීමට 2021 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා තිබුණද, 2023 ජනවාරි මාසය වන තුරුත් එම මුදල් ලැබී නොතිබුණි. | වන්දි ගෙවීම්, මාර්ග සංවර්ධන අධිකාරියෙන් දැනුම් නොදෙන බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කළ යුතු වීම. |
| (ඈ) වන්දි හා පොලී ගෙවා අවසන් කර ඇති ඉඩම් කැබලි 30 ක් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 44 (1) වගන්තිය අනුව ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. | ලිපි ද්‍රව්‍ය හිඟතාව නිසා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලිපි ද්‍රව්‍ය ඉල්ලා ඇත. ලද විගස ඉදිරි කටයුතු සිදු කරන බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | පනත ප්‍රකාරව ලියාපදිංචි කටයුතු කළයුතු වීම. |

## 2.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මී පැණි නිෂ්පාදනය ප්‍රචලිත කිරීම සඳහා රු.1,264,994ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එහෙත්, රු.393,050කට මිල දී ගත් උපකරණ ප්‍රතිලාභීන් වෙත බෙදා දීම හැර මී පැණි නිෂ්පාදනය ප්‍රචලිත කිරීමට සිදුකළ වෙනත් කාර්යයක් නොවුණි. එමෙන්ම, මී මැසි පෙට්ටි 67ක් ඇතුළු විවිධ උපකරණ 84ක් මිල දී ගත් දින සිට භාවිතයට නොගෙන පැවැතිණි. | මී මැසි පෙට්ටි 67 භාවිතයට ගත නොහැකි වූ බවත් ප්‍රතිලාභීන් පුහුණු කර ඉතිරි ජනපද පෙට්ටි බෙදා දීමට කටයුතු කරන බවත් ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |
| (ආ) | දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වූ පොල්ගස්වත්ත ක්‍රීඩා පිටියක් සංවර්ධනය කිරීම 2021 ජූලි මාසයේ නිමකර තිබුණි. එහෙත්, 2022 ඔක්තෝබර් වන විටත් එම ක්‍රීඩා පිටිය භාවිතයට නොගෙන වල් බිහි වී අත්හැර දමා තිබුණු බැවින් එය සංවර්ධනය සඳහා වැය කළ රු.1,470,100ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | දැරණියගල ප්‍රාදේශීය සභාවට අයත් බැවින් පිළිසකර කර ක්‍රීඩා සඳහා යොදවා ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත. | ව්‍යාපෘති සම්බන්ධව පසු විපරම් කටයුතු සිදුකළ යුතු වීම. |
| (ඇ) | අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කුළුබඩු නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 43 දෙනෙකු වෙත උපකරණ ලබා දී තිබුණද, ඉන් 34 දෙනෙකු සිය නිෂ්පාදන කටයුතු අත් හැරීම නිසා ඔවුන් වෙත ලබා දුන් රු. 3,991,600 ක උපකරණ පිරිවැය නිෂ්ඵල වියදමක් වී තිබුණි. | ප්‍රතිලාභීන්ගේ උපකරණ ආපසු ලබාගෙන ව්‍යාපෘතියට සම්බන්ධ වීමට කැමති අයට ලබා දීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | නිවැරදි ප්‍රතිලාභීන් හඳුනාගෙන නිවැරදි සැලසුම් සකස් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ඈ) | බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රීඩා පිටියක් සංවර්ධනයට රු.990,000 ක් වැයකර තිබුණ ද, කඩා ඉවත්කළ කළු ගල් කියුබ් 80ක් 2022 දෙසැම්බර් මාසය දක්වාම වසරක පමණ කාලයක් එම ක්‍රීඩා පිටිය මැද ගොඩගසා තිබීම හේතුවෙන් එය භාවිතා කළ නොහැකිව තිබුණි. | එම කළුගල් නොපමාව ඉවත් කර ගන්නා බව වතු අධිකාරී ප්‍රකාශ කර ඇති බව බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වීම. |

## 2.6 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තේ පැළ 222,671ක් මිල දී ගැනීම වෙනුවෙන් පැවැත්වූ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය ලැබීමට දින 18කට පෙර එම ඇනවුම භාර දී තිබුණි. එහෙත්, එම තේ පැළ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිර්දේශ හා ඇනවුම් කොන්දේසිවලට පටහැනි බැවින් රු.6,169,198ක් වූ ගැනුම් මිල මේ දක්වාම ගෙවා නොතිබුණි. එමෙන්ම, තාක්ෂණික ඇගැයීම් කමිටුවට තේ වගාව හා සම්බන්ධ ප්‍රවීනතාව සහිත නිලධාරියෙකු වෙනුවට කෘෂිකර්ම උපදේශකවරයෙකු පත්කර තිබුණි. | පිළිගනිමි. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් සිදුකරමින් පවතී. | ප්‍රසම්පාදන නීති, රීති අනුව කටයුතු කළ යුතුවීම. |

## 2.7 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවම මිල ගණන් ප්‍රතික්ෂේප කර මහන මැෂින් 43ක් මිල දී ගැනීම නිසා රු. 422,970ක පාඩුවක් සිදු වී තිබුණු අතර අවම මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ප්‍රසම්පාදන තීරණ ලබා දී ඇත්තේ MCZJ 9513 මැෂින් 30 කට පමණි. | අවම මිල ගණන් ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඊට හේතු දැක්විය යුතු වේ. |
| (ආ) | කුකුළු පාලන ගම්මාන ඇති කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.4,747,300 ක් වූ උපකරණ හා කුකුළු පැටවුන් 5848 ක් බෙදාහැර තිබුණි. පසුව, කිසියම් රෝගී තත්ත්වයක් මත කුකුල් පැටවුන් 4458ක් එනම්, මිල දී ගත් සංඛ්‍යාවෙන් සියයට 76ක් මිය ගොස් තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිල ගණන් ඇගයීම හැර, කිසිදු ආකාරයක තාක්ෂණික ඇගයීමක් සිදු නොකර මෙම මිල දී ගැනීම සිදු කිරීම ඊට හේතුව වී තිබුණි. | පශු වෛද්‍ය නිලධාරීන්ගේ නිර්දේශ, තාක්ෂණික කමිටුවේ නිර්දේශ හා දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත මිල දී ගැනීම සිදුකර ඇත. Foxcy නැමැති රෝගයෙන් සතුන් මියගිය අතර, ඒ වෙනුවට විටින් විට පැටවුන් මිල දී ගැනීම සිදු කරනු ලැබේ. | ප්‍රසම්පාදන නීති, රීති අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු වීම. |

## 2.8 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.1,938,425ක් වූ අර්ධ වශයෙන් නිම කළ සේවා පියස මධ්‍යස්ථාන 06ක් 2022 දෙසැම්බර් දක්වාම සම්පූර්ණ කර නොතිබුණි. | ප්‍රතිපාදන ලද පසු එම වැඩ නිම කළ හැකි බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | ප්‍රතිපාදන ලබාගෙන වැඩ කටයුතු අවසන් කළ යුතු වීම. |
| (ආ) | සේවා පියස මධ්‍යස්ථාන හා විවිධ කර්මාන්ත වෙනුවෙන් වූ බහුකාර්ය ගොඩනැගිලිවල ඉදි කිරීම් ප්‍රතිපාදන නොලැබීම මත අත්හැර දමා තිබුණි. මේ නිසා එම ඉදි කිරීම් නිම කරන තෙක් වැයකළ රු.8,569,900ක් අනාර්ථික වියදම් බවට පත් වී තිබුණි. | මෙම සියලුම ගොඩනැගිලි සඳහා ප්‍රමුඛතාව ලබා දී ප්‍රතිපාදන වෙන්කර ඒවායේ වැඩ නිම කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වමි. | ප්‍රතිපාදන ලබාගෙන වැඩ කටයුතු අවසන් කළ යුතු වීම. |

## 3. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා බහුකාර්ය අභ්‍යාසලාභීන් 1910 දෙනෙකු බඳවාගෙන තිබුණද, ඉන් 452 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දිනට ඉවත් වී තිබුණි. 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ඔවුන් වෙත රු.1,130,448,384 ක දීමනා ගෙවා තිබුණද, හය මාසික පුහුණුවෙන් පසු PL-01 ශ්‍රේණියේ ස්ථිරකර පත්වීම් ලබා දී නොතිබුණු අතර, රජයේ ගොවිපොළවල සහ අත්හැර දැමූ ඉඩම්වල කෘෂි තාක්ෂණය උපයෝගී කර ගනිමින් එළවළු සහ පළතුරු නිෂ්පාදන කටයුතුවලට යෙදවීමට ද කටයුතු කර නොතිබුණි. | පුහුණුව අවසන් වීමට නම් NVQ 3 විභාගය සමත් විය යුතු අතර 2022 පළමු කාර්තුව අවසන් වනවිට එම විභාග පවත්වන ලදී. එහි ප්‍රතිඵල ලැබෙන තෙක් තාවකාලික පදනම මත රජයේ ආයතනවලට අනුයුක්ත කර ඇත. නමුත් ඔබගේ නිරීක්ෂණ පරිදි රජයේ ගොවිපළවල සහ අතහැර දමා ඇති වගාකර නොමැති ඉඩම්වල වගා කටයුතුවල යෙදවීමට බහු කාර්ය බලකා දෙපාර්තමේන්තුව විසින් තීරණයක් ගෙන නොමැති බව දන්වමි. | බහුකාර්ය නිලධාරීන් රටේ පවතින ආර්ථික තත්ත්වය සලකා ආර්ථිකය නංවාලීම සඳහා යොමුකළ යුතු වීම. |